**මූලික සමාජ සේවා ඉලක්ක මතුවන ප්‍රදේශ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2016**

**-----------------------------------------------------------------------------------------**

මූලික සමාජ සේවා ඉලක්ක මතුවන ප්‍රදේශ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලං ර) හා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (ජජාසනි) අතර 2012 මාර්තු 28 දින එළඹි අංක එස්එල්පී - 105 දරන ණය ගිවිසුමේ III වාවස්ථාවේ 4(6) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**--------------------------------------------------------------------------------**

මූලික සමාජ සේවා ඉලක්ක මතුවන ප්‍රදේශ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මුදල් අමාත්‍යාංශයේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වර්තමානයේ සංවර්ධන කාර්යභාර අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ හා නියාමන දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සහ නැගෙනහිර, වයඹ, මධ්‍යම හා සබරගමුව පළාත් සභා, ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. සෞඛ්‍ය, වෛද්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීම හා ද්විතියික මට්ටමේ රෝහල්වල හා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ පහසුකම් හා උපකරණ වැඩිදියුණු කිරීම මඟින් අත්‍යවශ්‍ය ඖෂධවල නිෂ්පාදන ධාරිතාවය ශක්තිමත් කිරීම හා එමඟින් බෝ නොවන රෝග කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා දායකත්වය ලබාදීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 6,332 කට සමාන ජපන් යෙන් මිලියන 4,760 ක් වන අතර එයින් රු.මිලියන 5,155 කට සමාන ජපන් යෙන් මිලියන 3,935 ක් සැපයීම සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජූලි 23 දින ආරම්භ කරන ලද අතර 2019 ජූලි 23 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත්

කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිළදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව,

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව,

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

-----

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මා වෙත සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

උපදේශන සේවා සඳහා ගෙවීම් එකතුව රු.මිලියන 16.12 ට විදේශ විනිමය උච්චාවචනයන්ගේ ගැලපීම් සිදුනොකිරීම මත රු.757,058 කින් වියදම අඩුවෙන් දක්වා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුල සහ 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2016 දෙසැම්බර් 31 දිනට | |
| | ජපන් යෙන් මිලියන | රු. මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන |
| ජජාසනි | 3,935 | 5,155 | 839 | 791 | 997 | 2,454 | 3,014 |
| ශ්‍රීලංර | 825 | 1,177 | 521 | 350 | 451 | 603 | 822 |
| එකතුව | **4,760** | **6,332** | **1,360** | **1,141** | **1,448** | **3,057** | **3,836** |

### 3.2 භෞතික ප්‍රගතිය

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, වරකාපොල, ගල්ගමුව, තෙල්දෙණිය සහ කලවංචිකුඩි යන මූලික රෝහල්හි ධාරිතා වැඩිදියුණු කිරීම සැළසුම් කර තිබුණි. කෙසේ වුවද, වරකාපොල, ගල්ගමුව සහ කලවංචිකුඩි මූලික රෝහල්හි සිවිල් ඉදිකිරීම් කටයුතු 2016 නොවැම්බර් 23 දින වනවිට සම්පූර්ණ කිරීමට අපේක්ෂා කර තිබුණද, 2016 දෙසැම්බර් 31 දින වනවිටත් එම කටයුතු සම්පූර්ණ කර ප්‍රාදේශීය සෞඛ්‍ය අධිකාරීන් වෙත භාරදී නොතිබුණි. තවද, තෙල්දෙණිය මූලික රෝහලේ නව ශල්‍යාගාර සංකීර්ණයේ සහ අධිකරණ වෛද්‍ය ඒකකයේ ඉදිකිරීම් කටයුතු 2014 පෙබරවාරි 12 වන දින ආරම්භ කර තිබූ අතර සැළසුම් නිර්මාණ අසාර්ථකවීම් සහ වෙනත් පරිපාලන දුර්වලතා නිසා ඉදිකිරීම් කටයුතු 2016 දෙසැම්බර් 31 දින වනවිටත් සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘති ලේඛණ අනුව, පහසුකම් සහ උපකරණ වැඩිදියුණු කිරීම තුළින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අත්‍යවශ්‍ය ඖෂධ නිෂ්පාදන ධාරිතාව ශක්තිමත් කිරීම අපේක්ෂා කර තිබුණි. එම නිසා ජපන් යෙන් මිලියන 1244 කට සමාන රු.මිලියන 1630 ක ඇස්තමේන්තු ගත පිරිවැයක් යටතේ නිෂ්පාදනාගාර ගොඩනැගිල්ල සංවර්ධනය සහ යන්ත්‍ර සූත්‍ර නවීකරණය තුළින් නිෂ්පාදන ධාරිතාව වැඩිදියුණු කිරීමට අදාළ කටයුතු 2016 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණි. භෞතික ප්‍රගති වාර්තා අනුව, 2017 ජනවාරි 11 දින ගොඩනැගිලි ඉදිකිරීම සහ යන්ත්‍ර සූත්‍ර ප්‍රසම්පාදනය සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය පමණක් සිදුකර තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**------------------------**

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ඉදිකිරීම් කටයුතුවල මූලික අදියරේදී ලබාගන්නා ලද උපදේශන සේවය අසාර්ථකවීම මත තෙල්දෙණිය මූලික රෝහලේ ඉදිකිරීම් කටයුතු මන්දගාමීව සිදුවී තිබුණි. එමනිසා 2016 සැප්තැම්බර් 23 දින සිට වෙනත් උපදේශකවරයකුගේ සේවය ලබාගෙන තිබූ අතර ඒ සඳහා රු.මිලියන 1.60 ක අතිරේක පිරිවැයක් දරා තිබුණි.

(ආ) තෙල්දෙණිය මූලික රෝහලේ ශල්‍යාගාරය සහ වෛද්‍ය දැඩි සත්කාර ඒකකය සඳහා අළුතෙන් ඉදිකළ ගොඩනැගිලිවල විද්‍යුත් හා යාන්ත්‍රික පද්ධති ස්ථාපනය කිරීම ඉදිකිරීම් කටයුතුවලට සමගාමීව සිදු කළ යුතු වුවත් එය එලෙස සැලසුම් කර නොතිබූ අතර ඒ සඳහා රු.මිලියන 147.03 ක පිරිවැය සහිත වෙනම කොන්ත්‍රාත්තුවක් 2016 පෙබරවාරි මසදී පිරිනමා තිබූ බව නිරීක්ෂණය විය. කෙසේවුවද එම කටයුතු දෙසැම්බර් 31 දින වනවිටත් නිමකර නොතිබුණි.

(ඇ) තෙල්දෙණිය මූලික රෝහලේ ශල්‍යාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමේදී මගී සෝපානය සහ වෙනත් වැඩ සඳහා දරා තිබූ එකතුව රු.මිලියන 17.29 ක් වූ පිරිවැය 2014 පෙබරවාරි 11 දින ඉදිරිපත් කළ මිනුම් පත්‍රිකා තුළ ඇතුළත් කර නොතිබූ අතර එය අමතර වැඩ ලෙස ඇතුළත් කර 2016 පෙබරවාරි 25 දින අයකර ගෙන තිබුණි.

**3.4 මතභේදයට තුඩුදෙන කරුණු**

**------------------------------**

තෙල්දෙණිය මූලික රෝහල ඉදිකිරීම සම්බන්ධව තෝරාගත් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබූ මිළ ගණන් ඉංජිනේරුවරයාගේ ඇස්තමේන්තුවේ රේටයන් හා සියයට 32 සිට සියයට 568 දක්වා ඉහළ පරාසයක විචල්‍යතාවන් ගෙන තිබූ බව නිරීක්ෂණය විය. ඉංජිනේරුවරයාගේ ඇස්තමේන්තුව තාත්විකව පිළියෙල කර නොමැති බව මෙමඟින් පෙන්නුම් කරයි.